## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

## පළාත් පාලන සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) P163305

# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි (REOI)

# උතුරු, නැගෙනහිර, උතුරු මැද හා ඌව පළාත්වල, 2022 වර්ෂය සඳහා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIUs) සඳහා පුද්ගල උපදේශකයන්ගේ සේවය ලබාගැනීම

පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය (SMPCLGA) විසින්, ලෝක බැංකුවේ හා යුරෝපා සංගමයේ (EU) මූල්‍ය සහයෙන් පළාත් පාලන සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය උතුරු, නැගෙනහිර, උතුරු මැද හා ඌව පළාත් සභා තුළින් ක්‍රියාත්මක කරනු ලබයි.

LDSP ව්‍යාපෘතිය ඵලදායි හා ප්‍රතිචාරී පළාත් පාලන සේවා සැපයුමක් හා වගකිව යුතු පාලනකරණයක් උදෙසා, උතුරු නැගෙනහිර ඌව හා උතුරු මැද පළාත්වල පළාත් පාලන බලධාරී ආයතන (එනම්, මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා) ශක්තිමත් කිරීම අරමුණු කරයි. LDSP ව්‍යාපෘතිය විසින් සේවා සැපයීම් වැඩිදියුණු කිරීම සඳහා සහ ඔවුන්ගේ පුරවැසියන් වෙත වගකීම සංස්ථායතනය සඳහා මෙම පළාත්වල සියලුම පළාත් පාලන ආයතන 134 සඳහා මූලික පැවරුම් (BT) හා කාර්ය සාධන පැවරුම් (PT) සිදු කරනු ලබයි.

මෙම අවශ්‍යතාවය සපුරාලනු පිණිස, LDSP ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (PCU) විසින් කෙටි කාලීන පුද්ගල උපදේශකයන්ගේ සේවය ලබාගැනීමට අපේක්ෂා කරයි. අදාළ උපදේශකයන් PIUවල ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ හෝ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරනු ඇත. මෙම පුද්ගල උපදේශකයන්, ප්‍රධාන වශයෙන්, යොමු කිරීමේ අනුදේශ (TOR) ප්‍රකාරව අදාළ අරමුණු කරා ළඟා වී ඒවා ඉටුකරලීමේ වගකීම දරයි.

**මූල්‍ය කළමනාකරණ උපදේශක - PCU සඳහා - LDSP/PCU/IC/FMC/1 (තනතුරු 01)**

**පැවරුමට ආශ්‍රිත නිර්දිෂ්ඨ කාර්යය**

රාජ්‍ය සේවා කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා පළාත් පාලන ආයතන ඇතුළත ප්‍රතිඵල – පාදක මූල්‍යකරණය සඳහා මනෝගතිය මාරු වීමක් අවශ්‍ය වේ. එසේ හෙයින් අමාත්‍යාංශය විසින්, පුනර්වාචක, උපදේශකත්ව හා කාර්ය ඉටු කිරීම තුළ – ඉගෙනුම භාවිත කරමින් වෘද්ධික ක්‍රමවේදයක් මගින් කාර්ය – සාධන පැවරුම් (PT) හඳුන්වාදීමට අමාත්‍යාංශය තීරණය කොට ඇත. ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකක සම්බන්ධයෙන් ගතහොත් මෙය පළාත් පාලන ආයතනවලට, මූලික PT වාරවලදී සහාය වෙමින් එම ආයතනවලට සිදුවිය හැකි අවාසිදයක ප්‍රතිඵල සහ/ හෝ ජයග්‍රහණ පිළිබඳ නිවැරදි නොවන වාර්තා ලබාදීම සම්බන්ධයෙන් වන අවදානම අවම කළ හැක. එසේ හෙයින්, අදාළ උපදේශකහට ලෝක බැංකුව හා ආසියානු පදනම සමග සමීප සහයෝගීතාවයෙන් BT හා PT ක්‍රියාකාරකම් දෙකෙහිම අරමුණු, ක්‍රියාපටිපාටිය සංවිධානය හා කළමනාකරණය මත පළාත් පාලන බලධාරීන් සමග සමීපව කටයුතු කිරීම සම්බන්ධව වන වගකීම සතුවේ. පැවරුමේ අරමුණු ප්‍රකාරව උපදේශක විසින් පහත සඳහන් වැඩකටයුතු සිදුකළ යුතුවේ.

**පළමුවන කාර්යය : ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය වෙනුවෙන් BT හා PT ක්‍රියාකාරම් සඳහා සහාය වීම.**

**දෙවන කාර්යය : PT දියත් කිරීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධව අමාත්‍යාංශයට ලෝක බැංකුවට සහ කොළඹ යුරෝපා සංගමයට වාර්තා කිරීම.**

**අදාළ පුද්ගල උපදේශන සතුව පහත සඳහන් කරුණු සපුරා තිබිය යුතුය.**

**මූලික සුදුසුකම් හා පළපුරුද්ද - අනිවාර්ය වේ.**

a) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල උපාධියක් එයට මූල්‍ය කළමනාකරණය, ආර්ථික විද්‍යාව, රාජ්‍ය පරිපාලනය හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයන් ඇතුළත් විය යුතුය.

b) අදාළ ක්ෂේත්‍රයන් පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ සාමාජිකත්වය.

C) සුදුසුකම් ලැබීමෙන් පසු, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වැඩසටහන් සම්බන්ධව පර්යේෂණ කිරීමේ විධිමත්ව සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ අවම වසර 10 ක කාරක පළපුරුද්ද.

**අමතර සුදුසුකම් හා පළපුරුද්ද**

1) රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වැඩසටහන් සම්බන්ධව පර්යේෂණ කිරීමේ විධිමත්ව සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල කළමනාකරණ පළපුරුද්ද.

2) විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල ගිණුම්කරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 5 ක කළමනාකරණ පළපුරුද්ද.

3) ප්‍රදර්ශණය කළ ව්‍යාපෘති/ වැඩසටහන් කළමණාකරණ කුසලතා; විශිෂ්ඨ අන්තර් – පුද්ගල, ගැටලු නිරාකරණය හා කණ්ඩායම් කුසලතා සහ දැඩි සේවාදයක අවධානය සහිතව සංකීර්ණ සංවර්ධන ගැටලු සඳහා තුලනාත්මක විසඳුම් සෙවීමට නව ක්‍රමවේදයන් හා උපායමාර්ගිකව සිතීමේ හැකියාව.

4) ගුණාත්මක සහ / හෝ ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදයන් හා විශ්ලේෂණයේ පළපුරුද්ද.

5) විශිෂ්ඨ කථන හා ලිඛිත ඉංග්‍රීසි භාෂා සන්නිවේදනයේ කුසලතා තිබීම අනිවාර්ය වේ.

6) ලෝක බැංකුව මූල්‍ය ලේඛන, යුරෝපා සංගම් අරමුදල් සැපයීම් හා දයකත්ව – අරමුදල් හා රජයේ ව්‍යාපෘති සම්බන්ධව අධීක්ෂණය හා අගැයුම් කිරීමේ සනාථ කළ දැනුම හා පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමක් වේ.

**1. තනි පුද්ගල උපදේශකවරයෙකු සේවයේ යෙදවීම - ඉංජිනේරු / ප්‍රසම්පාදන උපදේශක (නැගෙනහිර පළාත) - LDSP/IC/PC/EP/1**

**2. තනි පුද්ගල උපදේශකයෙකු සේවයේ යෙදවිම - ඉංජිනේරු / ප්‍රසම්පාදන උපදේශක (උතුරු මැද පළාත) - LDSP/IC/PC/NCP/1**

**3. තනි පුද්ගල උපදේශකයකු සේවයේ යෙදවිම - ඉංජිනේරු / ප්‍රසම්පාදන උපදේශක (උතුරු පළාත) - LDSP/IC/PC/NP/1**

**4. තනි පුද්ගල උපදේශකයකු සේවයේ යෙදවිම - ඉංජිනේරු / ප්‍රසම්පාදන උපදේශක (ඌව පළාත) - LDSP/IC/PC/UP/1**

**තනතුරු හතරයි**

**පැවරුම සම්බන්ධව වන විශේෂ කාර්යය**

a) ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව පළාත් පාලන ආයතන බලධාරීන් විසින්, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය නියමිත කාල රාමුව තුළ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේදී නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (පළාත්) සමග සම්බන්ධීකරණය කිරීම.

b) ප්‍රසම්පාදන අත්පොතෙහි හා ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි (POM) නිර්දිෂ්ඨ පරිදි වන ප්‍රසම්පාදන වැඩ පිළිවෙල අනුව කටයුතු කරමින්, භාණ්ඩ, වැඩ සේවා හා උපදේශක කාර්ය ලබාගැනීම සඳහා ලංසු ලේඛන පිළියෙල කිරීමේදී, පළාත් බලධාරීන් තුළ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ කටයුතු සඳහා සමීපව සහාය විම හා අධීක්ෂණය කිරීම

c) අදාළ පළාත් තාක්ෂණ දෙපාර්තමේන්තුවලින් හා ප්‍රතිලාභීන් වෙතින් යොමු කිරීමේ අනුදේශ (TOR) හෝ තාක්ෂණ පිරිවිතරයන් නියමිත කාලරාමුව තුළ ලබාගැනීම පිණිස, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ සමග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේදී සමීපව කටයුතු කිරීම.

d) මූලික කොටස් හා කාර්යසාධන කොටස් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත උපව්‍යාපෘතිවලට සම්බන්ධ සැලසුම් ඇස්තමේන්තුකරණ හා ප්‍රමාණපත්‍ර සකස් කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයට සහායවීම.

e) අර්ධ ගෙවීම්වල බිල්පත් ඉදිරිපත් කිරීමට සහාය වෙමින් හා උපදෙස් දෙමින් හා බිල්පත් පරීක්ෂා කරමින් කොන්ත්‍රාත්කරුවන්හට ගෙවීම් සිදුකිරීම කඩිනම් කිරීම සඳහා පළාත් බලධාරීන්හට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයට මාර්ගෝපදේශ සැපයීම.

f) ලෝක බැංකු හා LDSP මාර්ගෝපදේශ මත අවධාරණය වෙමින් ප්‍රසම්පාදන කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන පළාත් බලධාරී කාර්ය මණ්ඩලය ප්‍රසම්පාදන කළමනාකරණයේ ධාරිතා සංවර්ධනය සඳහා සහායවීම.

g) විවිධ වූ කොන්ත්‍රාත් සකස් කිරීමේ ප්‍රගතිය අභිමුඛ වූ නිශේධක හා අනෙකුත් ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයෙහි අවධානය යොමු විය යුතු කරුණුද මතුකොට දැක්වීම් ඇතුළත්ව පළාත් මට්ටමින් ප්‍රසම්පාදන ප්‍රගති වාර්තා මාසික පදනමින් සකස් කිරීම.

**අදාළ තනි පුද්ගල උපදේශක සතුව පහත සඳහන් කරුණු සපුරා තිබිය යුතුය.**

**මූලික සුදුසුකම් හා පළපුරුද්ද - අනිවාර්ය වේ.**

a) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් BSc සිවිල් ඉංජිනේරු වරලත් උපාධියක්

b) ඉදිකිරීම් හෝ අදාළ ක්ෂේත්‍රයේ මාස්ටර්ස්/ පශ්චාත් උපාධියක්

c) ප්‍රසම්පාදන හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක්/ සහතිකයක්.

d) විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සුදුසුකම් ලබාගැනීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක කාරක පළපුරුද්ද

**අමතර සුදුසුකම් හා පළපුරුද්ද**

1) ප්‍රසම්පාදන හා තාක්ෂණික සම්බන්ධ කාර්යයන්හි පළාත් / පළාත් පාලන/ ප්‍රජා තලයේ අවම වශයෙන් වසර 03 ක කරක පළපුරුද්ද.

2) ලෝක බැංකු / ආසියානු සංවර්ධන බැංකු / JICA ආයතන විසින් අරමුදල් සැපයූ ව්‍යාපෘතිවල අවම වශයෙන් වසර 03 ක කාරක පළපුරුද්ද (ලෝක බැංකු අනුකූල ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටින් භාවිත කිරීමේ දැනුම හා පළපුරුද්ද)

3) මූලික මෘදුකාංග යෙදවුම් (එක්සෙල් වර්ඩ්, පවර් පොයින්ට් හෝ ආශ්‍රිත), අන්තර්ජාල හා ඊමේල්, MS ව්‍යාපෘති හා ප්‍රිමාවේරා භාවිතයේ ප්‍රවීණතාවය හා පළපුරුද්ද.

4) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය.

**පාරිසරික හා සමාජ ආරක්ෂණ උපදේශක (ESSMC) - ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය - LDSP/IC/PCU/ESSG/1-PCU සඳහා**

**(තනතුරු එකයි)**

**පැවරුමට අදාළ නිර්දිෂ්ඨ කාර්යය**

a) අදාළ ESSC උපදේශක විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල ආරක්ෂණ අනුකූලතාවයන් සහතික කිරීමේ වගකීම දරයි. (පාරිසරික හා සමාජ ආරක්ෂණ)

b) කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙන ඇති අවදානම අවම කිරීමේ පියවර/ ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම.

C) අවශ්‍යතාවය මත සමාජ අවදානම අවම කිරීමේ ක්‍රියාමාර්ගවලට අදාළව පාරිසරික හා සමාජ අවදානම අවම කිරීමේ (ESMPs) ව්‍යාපෘති සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම.

d) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මහජනතාව හා අදාළ බලධාරීන් දැනුවත් කිරීම (උපයෝගිතා විස්ථාපන හා හදිසි සමීක්ෂණය ආදිය) හා එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

e) ක්‍රියාකාරී දුක්ගැනවිලි සඳහා විසඳුම් යාන්ත්‍රණයක් සිදු කිරීම හා පසු විමසුම් සමග, දුක්ගැනවිලි, පැමිණිලි භාර ගැනීම.

f) ඉදිකිරීම් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති විය හැකි මහජනතාව හා මාර්ග භාවිත කරනු ලබන අය හට අපහසුතා ඇති නොවන අයුරින් කටයුතු කිරීම ( ශබ්ද, දූහුවිලි, කාණු අවහිරතා, ප්‍රවේශ මාර්ග නැතිව යාම, ජලය එක්රැස්වීම හා ජලයෙන් යටවීම, අනවශ්‍ය රථවාහන තදබදයෙන්, හදිසි අනතුරු අවදානම, ආදිය)

g) පාරිසරික හා සමාජ කළමනාකරණය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් හා උප කොන්ත්‍රාත්කරුවන් පුහුණු කිරීමේ කටයුතු වලට පහසුකම් සැපයීම.

h) අවශ්‍යතා මත, සෞඛ්‍ය අවදානම අඩු කිරීමේ කටයුතු සම්බන්ධව ESMP ව්‍යාපෘතිය සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම.

**තනි පුද්ගල උපදේශක සතුව පහත සඳහන් කරුණු සපුරා තිබිය යුතුය.**

**මූලික සුදුසුකම් හා පළපුරුද්ද - අනිවාර්යය වේ.**

a) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ / ක්ෂේත්‍රවල ප්‍රථම උපාධියක්

b) පාරිසරික ඉංජිනේරු, පාරිසරික විද්‍යා, පාරිසරික හෝ ස්වාභාවික සම්පත් කළමනාකරණ හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක උසස් උපාධියක් (PhD හෝ මාස්ටර්ස්),

c) පාරිසරික අවදනම් කළමනාකරණ අංශයේ, අදාළ අවම වසර පහක පූර්ණ කාලීන වෘත්තීය පළපුරුද්ද.

d) ලෝක බැංකු හෝ වෙනත් විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල ESSM ක්ෂේත්‍රයේ දැනුම හා පළපුරුද්ද.

**අමතර සුදුසුකම් හා පළපුරුද්ද**

5) අවදානම අවම කිරීමේ හා පාරිසරික හා සමාජීය බලපෑම් අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියේදී ව්‍යාපෘති හානි වීම් / අවදානම් තක්සේරු කිරීම මෙයට වැදගත් පාරිසරික හා සමාජීය මානයන් සහිත ව්‍යාපෘති අධීක්ෂණය / පරීක්ෂා කිරීම / සුපරීක්ෂණය සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

6) ලෝක බැංකු / ආසියානු සංවර්ධන බැංකු / JICA ආයතනවල අරමුදල් සැපයූ ව්‍යාපෘතිවල (ලෝක බැංකුවේ ආරක්ෂණ ප්‍රතිපත්ති / ESSF සහ ES ප්‍රතිපත්ති හෝ / සමාන ප්‍රමිතින්) අවම වශයෙන් වසර 03 ක කාරක පළපුරුද්ද.

7) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ස්ථානවලට හා උපව්‍යාපෘති ප්‍රදේශවලට චාරිකා කිරීමට කැමති විය යුතු අතර, මූෂික මෘදුකාංග යෙදවුම් (එක්සෙල්, වර්ඩ් පවර් පොයින්ට් හෝ ආශ්‍රිත) අන්තර් ජාල හා ඊමේල් කටයුතු වල ප්‍රවීනත්වය හා පළපුරුද්ද තිබිය යුතුය.

8) දැඩි අන්තර් – පුද්ගල හා සන්නිවේදන කුසලතා තිබිය යුතු අතර, සිංහල / දෙමළ හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය සතුවිය යුතුය.

**වේතන ගෙවීම් :**

උපදේශකගේ මිල උපලේඛනය සහ සුදුසුකම් හා පළපුරුද්ද මත සාකච්ඡා කළ හැක.

**තෝරා ගැනීමේ නිර්ණායක :**

**උපදේශකගේ යෝජනා පහත සඳහන් සංරචකයන්ගෙන් යුක්ත විය යුතුය:**

අ) සියලු අවශ්‍යතා **උපදේශක** විසින් සපුරාලන බවට ප්‍රදර්ශනය කෙරෙන ලේඛනද ඇතුළත්ව යෝජනාවේ මෙහෙයුම් හා තාක්ෂණ කොටස,

ආ) **යොමු කිරීමේ අනුදේශවල ගෙවීම් නියමයන්** ප්‍රකාරව සම්පූර්ණ කළ මිල උපලේඛනය තාක්ෂණ යෝජනාව සඳහා ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, ඔහුගේ / ඇයගේ මිල යෝජනාව සම්බන්ධව සාකච්ඡා කරනු ඇත. එම අවස්ථාව සාර්ථක නොවුවහොත්, ඊලඟ වැඩිම ලකුණු ලාභියා කැඳවනු ඇත. කෙසේ වෙතත්, මූලික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.

තනි පුද්ගල උපදේශකයන් තෝරාගැනීම, තනි පුද්ගල උපදේශකයන් තෝරාගැනීම සඳහා උපදේශක සේවා සඳහා වන ලෝක බැංකුවේ නිර්දිෂ්ඨ මාර්ගෝපදේශ : ජූලි 2016, ආයෝජන ව්‍යාපෘති අරමුදල්, භාණ්ඩ, වැඩ, උපදේශන නොවන හා උපදේශක සේවා – 2018 අගෝස්තු සංශෝධිත, ආයෝජන ව්‍යාපෘති ප්‍රසම්පාදනය – අනුමත උපදේශක සේවා සඳහා තනි පුද්ගල උපදේශකයන් තෝරා ගැනීමේ ක්‍රමවේදය තුළින් සිදු කෙරේ.

උපදේශක සේවා සඳහා වන වඩාත් විස්තරාත්මක යොමු කිරීමේ අනුදේශ (TOR) ලේඛනය හා අනෙකුත් අදාළ ලේඛන පහත සඳහන් ලිපිනයෙන් හෝ ඊමේල් : ldspmpclg2018@gmail.com මගින් ලබාගත හැක. **දුරකථනය** : 011 2452432

**අයදුම් කිරීමේ ක්‍රමවේදය :**

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් විසින්, මෙම තනතුරු වලට අදාළ යොමු කිරීමේ අනුදේශ ප්‍රකාරව, මෙම සේවා සැපයීම සඳහා තමන් සතු සුදුසුකම් හා පළපුරුද්ද ප්‍රදර්ශනය කරනු පිණිස අදාළ තොරතුරු ද ඇතුළත්ව (සමාන පැවරුම් වල විස්තර, සමාන තත්වයන් තුළ පළපුරුද්ද, යෝග්‍ය නිපුණතා, ආදිය) **ජීව දත්ත හා මිල උපලේඛනය** ඉදිරිපත් කළ යුතුය. රජයේ / රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු වේ.

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් හට අවශ්‍ය වැඩිදුර විස්තර, යොමු කිරීමේ අනුදේශ (TOR) යෝජනා සඳහා ඉල්ලීම් ලේඛන හා විමසීම් රජයේ රාජකාරී දිනවල, **2022 මාර්තු 21 දින සිට 2022 මාර්තු 28 දින දක්වා, 0900 පැය හා 1530 පැය** අතර කාලය තුළ, පහත සඳහන් ඇමතුම් විස්තර මගින් ලබාගත හැක. සියලුම අයදුම්පත්, ලියාපදිංචි තැපැලෙන් **අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ එක් එක් තනතුර සඳහන් කොට, 2022 මාර්තු 29 දිනට** පෙර පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති, අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රසම්පාදන ඒකකය, මූල්‍ය අංශය,**
**පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,**
**අංක : 330, යුනියන් පෙදෙස, කොළඹ 02**
**2022 මාර්තු 21**